රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර
සංවර්ධන අමාත්‍යාංශය

# වාර්ෂික කාර්යසාධන වාර්තාව
# 2018

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා**

රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍ය

**රවීන්ද්‍ර හේවාවිතාරණ මහතා**

රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්.

# අමාත්‍යතුමාගේ පණිවුඩය



2018 වසරට අදාලව මාගේ අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන විසින් අත්පත් කරගත් ප්‍රගතිය විදහා දැක්වෙන 2018 කාර්සාධන වාර්තාව සඳහා පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම මාගේ සතුටට හේතු වේ.

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය 2015.09.21 දින ප්‍රකාශයට පත් කරන ලද අංක 1933/13 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය හා 2015 .11.24 ප්‍රකාශයට පත් කරන ලද අංක 1942/10 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයන් මඟින් නව අමාත්‍යාංශයක් ලෙස ආරම්භය සටහන් කරයි. මෙම අමාත්‍යාංශයට මහනුවර නගර සංවර්ධන විෂය පැවරෙන්නේ 2018.05.12 දිනැති අංක 2070/56 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මඟිනි.

මෙම අමාත්‍යාංශයේ ප්‍රමුඛ වගකීම බවට පත්වන්නේ පාඩු ලබන රාජ්‍ය ව්‍යවසායන් ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය තුළින් ඉහළට ඔසවා තැබීමයි.මෙම අරමුණ පෙර දැරි කරගෙන අමාත්‍යාංශය විසින් බොහෝ ක්‍රියාකාරකම් සිදු කර ඇත. මෙහිදි විශේෂයෙන්ම පාඩු ලබන වැවිලි ක්ෂේත්‍රය පිළිබඳව අපගේ විශේෂ අවධානය යොමු කළෙමු. එහිදි එම ව්‍යවසායන් ලාබ ලබන තත්ත්වයට ගෙන ඒම සඳහා නව ව්‍යාපෘතින් හඳුන්වා දීමට අදාළව ඇති හැකියාව සොයා බලා ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමට අදාල වැවිලි සමාගම් දැනුවත් කර ඇත.

තවද, විශේෂඥ කමිටුවේ සහාය ඇතිව අදාල ආයතන වල ප්‍රගති සමාලෝචන කටයුතු විධිමත් කිරීමට පියවර ගන්නා ලදී. එසේම හිඟ අර්ධසාධක අරමුදල් සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් වලට අදාල ගැටළු මුළුමනින්ම පාහේ නිම කිරීමට හැකියාව ලැබී තිබීම අප ලද විශේෂ ජයග්‍රහණයකි.

ශ්‍රී ලංකන් ගුවන් සමාගම ශ්‍රී ලාංකික අනන්‍යතාවය ලොවට විදහාපාන සලකුණක් වශයෙන් තව දුරටත් රැක ගැනීම අපගේ අපේක්ෂාවයි. එහිදි ශ්‍රී ලංකන් ගුවන් සේවය පාඩු ලබන තත්ත්වයෙන් මුදා ගැනීම සඳහා උපාය මාර්ගික සහකරුවකුගේ සහාය ලබා ගැනීමටත්, ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය හරහා පාඩුව අවම කර ගනිමින් මෙම සේවාව වඩා විධිමත් ලෙස පවත්වා ගෙන යාමටත් කටයුතු ආරම්භ කළෙමු.

ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය ක්ෂේත්‍රයේ දැවන්ත හස්තයන් වන රාජ්‍ය බැංකු වල හිමිකාරිත්වය මෙම අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වේ. එහිදි බාසල් III සම්මුතිය ප්‍රකාරව අදාල බැංකු වලට මූල්‍ය ප්‍රග්ධන අවශ්‍යතාවය සුරක්ෂිත කිරීමෙහිලා අප විසින් අවශ්‍ය මඟ පෙන්වීම හා දායකත්වය ලබා දී ඇත්තෙමු. එහිදි සමාන අරමුණු අත්පත් කර ගැනීම මූලික කර ගත් බැංකු ඒකාබද්ධ කිරීමටත්, ප්‍රාග්ධන අවශ්‍යතාව සුරක්ෂිත කරලීමටත්, නව්‍යකරණය තුළින් බැංකු ක්ෂේත්‍රය හමුවේ ඇති තරගකාරීත්වය ජය ගැනීමටත් රාජ්‍ය බැංකු යොමු කරලීමට පියවර ගෙන ඇත්තෙමු.

මෙම අමාත්‍යාංශයේ විෂය පථයට අළුතින් එකතු වූන මහනුවර නගර සංවර්ධන විෂය අපගේ සුවිශේෂි අවධානයට පාත්‍ර වේ.එහිදි වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ව්‍යාපෘති කාර්යාල මඟින් මහනුවර නගරය තුළ ක්‍රියාත්මක වන දැවැන්ත සංවර්ධන ව්‍යාපෘති 30කට අධික සංඛ්‍යාවක ප්‍රගතිය අධීක්ෂණය හා නියාමන කාර්යය මෙම අමාත්‍යාංශය මගින් සිදු කරයි.එක්සත් ජාතීන්ගේ සංවිධානය මඟින් ලෝක උරුම නගරයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති කන්ද උඩරට මහනුවර නගරයෙහි භෞමික, සංස්කෘතික හා සමාජීය වටපිටාව ආරක්ෂා වන පරිද්දෙන් සෝබමාන නගරයක් ලෙස සංවර්ධනය කිරීම අපගේ අරමුණයි.

ඒ අනුව මගේ නායකත්වය යටතේ ඉදිරියේදී තවදුරටත් මහනුවර නගරය කේන්ද්‍ර කර ගත් සංවර්ධන ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගනු ඇත.

ඉහත සියලු කාර්යයන් සඵලදායිව හා සාර්ථකව නිම කරවා ගැනීමට අමාත්‍යාංශ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය මඟින් මා හට ලැබෙන සුවිශේෂි සහයෝගය මාගේ පැසසුමට ලක් වේ.

**ලක්ෂ්මන් කිරිඇල්ල**

රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍ය

# <u>ලේකම්තුමාගේ පණිවුඩය</u>



ශ්‍රී ලංකාවේ රජයට අයත් ව්‍යවසායන් අතුරින් හඳුනාගත් ලාභ නොලබන ව්‍යවසායන් ප්‍රතිසංස්කරණය කිරීම මෙන්ම මහනුවර නගරය සංවර්ධනය කිරීමේ වගකීම රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යාංශයට පැවරී ඇත. 2018.05.12 දිනැති අංක 2070/56 දරණ ගැසට් නිවේදනය අනුව ලංකා සීනි සමාගම, පැල්වත්ත, සෙවනගල, කන්තලේ යන සීනි සමාගම් හා උක් පර්යේෂණ ආයතනය ද මෙම අමාත්‍යාංශය යටතට එක්වේ.

මෙම වසර තුලදී රටේ සමස්ත ආර්ථිකයට ඉමහත් බරක් වූ රාජ්‍ය ව්‍යවසායන් අධීක්ෂණය කිරීමේ ක්‍රියාවලිය සඳහා අපගේ අවධානය යොමු කර ඇති අතර ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබිය.

මේ අමාත්‍යාංශය යටතේ වතු සමාගම්වල පාඩු අඩු කර කාර්යසාධනය වැඩි කිරීම සඳහා ඒවා ප්‍රතිව්‍යුහගත කිරීම අඛණ්ඩව සිදු කෙරිණ. ඒ අනුව, වතු සමාගම් වල පාඩු අඩු කර ඒවායේ කාර්යසාධනය වැඩි දියුණු කිරීමට හැකි වී තිබේ. මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වතු සමාගම් තුනක ගෙවීමට ඉතිරි වී ඇති අර්ධසාධක අරමුදල් (EPF) සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් (ETF) හා වෙනත් ව්‍යවස්ථාපිත ගෙවීම් පියවීම සම්බන්ධීකරණය කිරීමද අමාත්‍යාංශය මගින් සිදු කෙරේ.

ශ්‍රී ලංකන් ගුවන් සේවය සඳහා නව අධ්‍යක්ෂ මණ්ඩලයක් පත්කර ඇති අතර නව උපායමාර්ගික සැලැස්මක් යටතේ ප්‍රතිව්‍යුහගත කිරීමේ කාර්යයන් අඛණ්ඩව සිදු කෙරේ.

අමාත්‍යාංශය යටතේ රාජ්‍ය බැංකු වල කාර්යසාධනයේ කැපීපෙනෙන වර්ධනයක් පෙන්නුම් කෙරේ. ලංකා බැංකුවේ ප්‍රාග්ධන අවශ්‍යතාවය සඳහා මහ භාණ්ඩාගාරය මගින් රු. බිලියන 5ක් ලබා දී ඇති අතර ආසියානු සංවර්ධන බැංකුව මගින් කලාපීය සංවර්ධන බැංකුවට ලබා දෙන ණය පහසුකම් හරහා එම බැංකුවේ සේවාවන් ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය ප්‍රාග්ධනය ලබාදීමට පියවර ගනු ලැබේ. එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා වැඩසටහන මගින් සාමාන්‍ය තත්වයන් යටතේ ණය ලබාගැනීමට නොහැකි ව්‍යවසායකයින්ට බැංකු මගින් මූල්‍ය සහය ලබාදේ. මහාභාණ්ඩාගාරය මගින් ලබාදෙනු ලැබූ පොලී සහනාධාර වැඩසටහන නව ව්‍යවසායන් සඳහා විශාල සහනයක් වන බව මෙහිදී සඳහන් කළ යුතුය.

ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනය අනුව රජයට 51% කොටස් හිමිකමක් ඇති ආයතන රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කල යුතු අතර විගණකාධිපති දෙපාර්තමේන්තුව මගින් විගණනය කිරීමට යටත් විය යුතුය. එම නිසා ආයතනවල විනිවිදභාවය තහවුරු කිරීම හා ප්‍රසම්පාදන ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය ඇති කිරීම සඳහා අළුතින් හඳුන්වා දෙනු ලැබූ විධිවිධාන වලට අනුගතකරවීමේ ප්‍රයත්නය අමාත්‍යාංශය භාරගෙන තිබේ.

අමාත්‍යාංශය වෙත පැවරී ඇති අතිමහත් වගකීම් සම්භාරය ඉටුකිරීම සඳහා අවශ්‍ය දැනුම සහිත මානව සම්පත ප්‍රමාණවත් නොවේ. මානව සම්පත් හිදස පියවීමේ පියවරක් ලෙස ප්‍රතිව්‍යුහගත කිරීමේ කාර්යයන් වලදී සහයදීමට විශේෂඥ කමිටුවක් පත්කිරීම සඳහා 2018 අගෝස්තු අවසානයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට අමාත්‍යාංශයට හැකි විය.

මෙම පසුබිම යටතේ අමාත්‍යාංශය මගින් එහි ආයතන සමගින් ඉටු කරනු ලැබූ ක්‍රියාකාරකම්වල කාර්යසාධනය ඇතුලත් 2018 කාර්යසාධන වාර්තාව සඳහා මෙම පණිවුඩය ලබාදීම මට සතුටකි.

මෙම සියළු කාර්යයන් ඉටු කිරීමේදී ගරු අමාත්‍යවරයාගෙන් හා ගරු නියෝජ්‍ය අමාත්‍යවරයාගෙන් ලැබුනු මහ පෙන්වීම හා සහය ඉතා අගය කරමි.

අපගේ මාර්ගෝපදේශ අනුගමනය කරමින් අපට සහය ලබාදෙන සියළු ආයතන ප්‍රධානීන්ට මාගේ කෘතඥතාවය පුදකරමි.

තවද මෙම සියළු කාර්යයන් සිදුකිරීමේදී මා හට සහය දැක්වූ අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලයට මාගේ හදපිරි ප්‍රණාමය පිරි නමමි.

**රවීන්ද්‍ර හේවාවිතාරණ**
රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්

# 2018 වසරේදී අමාත්‍යාංශය යටතේ පැවති ආයතනයන්හි සම්බන්ධීකරණ තොරතුරු

## බැංකු හා මූල්‍ය අංශය

- **ලංකා බැංකුව**

| | | |
|---|---|---|
| සභාපති | - | රොනල්ඩ් පෙරේරා මහතා |
| දු. අංක | - | 011 2348877 |
| ෆැක්ස් | - | 011 2452033 |
| විද්‍යුත් තැපැල | - | chairman@boc.lk |

- **මහජන බැංකුව**

| | | |
|---|---|---|
| සභාපති | - | හේමසිරි ප්‍රනාන්දු මහතා |
| දු. අංක | - | 011 2329822 |
| ෆැක්ස් | - | 011 2447473 |
| විද්‍යුත් තැපැල | - | chairman@peoplesbank.lk |

- **ජාතික ඉතිරිකිරීමේ බැංකුව**

| | | |
|---|---|---|
| සභාපති | - | අශ්වින් ද සිල්වා මහතා |
| දු. අංක | - | 011 2573334 |
| ෆැක්ස් | - | 011 2574002 |
| විද්‍යුත් තැපැල | - | chairman@nsb.lk |

- **රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව**

| | | |
|---|---|---|
| සභාපති | - | නිරෝෂන පෙරේරා මහතා |
| දු. අංක | - | 011 2573563 |
| ෆැක්ස් | - | 011 2573346 |
| විද්‍යුත් තැපැල | - | chairman@smib.lk |

- **ප්‍රාදේශීය සංවර්ධන බැංකුව**

| | | |
|---|---|---|
| සභාපති | - | කස්තුරි අනුරාධනායක  මහතා |
| දු. අංක | - | 011 2035460 |
| ෆැක්ස් | - | 011 2906877 |
| විද්‍යුත් තැපැල | - | chairman@rdb.lk |

- **ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව**

| | | |
|---|---|---|
| සභාපති | - | ජේ.ටී.එස්.පී. කාරියවසම් මහතා |
| දු. අංක | - | 011 2821232 |
| ෆැක්ස් | - | 011 2821213 |
| විද්‍යුත් තැපැල | - | chairman@lankaputhra.lk |

- **ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව**

| | | |
|---|---|---|
| සභාපති | - | එස්. දයානන්ද මහතා |
| දු. අංක | - | 011 2674700 / 11 |
| ෆැක්ස් | - | 011 2674705/ 6 |
| විද්‍යුත් තැපැල | - | chairman@slsbl.lk |

## සිවිල් ගුවන්සේවා අංශය

- **ලිට්රෝ ගෑස් ලංකා ලිමිටඩ්**

| | | |
|---|---|---|
| සභාපති | - | නිස්සංක නානායක්කාර මහතා |
| දු. අංක | - | 011 2327676 |
| ෆැක්ස් | - | 011 2327674 |
| විද්‍යුත් තැපැල | - | chairman@litrogas.com |

- **ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්) සමාගම**

| | | |
|---|---|---|
| සභාපති | - | රජාබ්දීන් මහතා |
| දු. අංක | - | 011 2327676 |
| ෆැක්ස් | - | 011 2327674 |
| විද්‍යුත් තැපැල | - | chairman@litrogas.com |

- **ශ්‍රී ලංකන් ගුවන් සේවය**

| | | |
|---|---|---|
| සභාපති | - | රංජිත් ප්‍රනාන්දු මහතා |
| දු. අංක | - | 019 7331000 |
| ෆැක්ස් | - | 019 7335100 |
| විද්‍යුත් තැපැල | - | chairman@srilankan.com |

## වැවිලි හා කෘෂිපාදක කර්මාන්ත අංශය

- **ජනතා වතු සංවර්ධන මණ්ඩලය**

සභාපති - එම්. ආර්. එම්. ආබ්ඩීන් මහතා

දු. අංක - 011 5733406

ෆැක්ස් - 011 2446577

විද්‍යුත් තැපැල - raj.reliant@gmail.com

- **ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව**

සභාපති - තිලක් මහානාම මහතා

දු. අංක - 011 2438530

ෆැක්ස් - 011 2438635

විද්‍යුත් තැපැල - slspc@sltnet.lk

- **සී/ ස ඇල්කඩුව වැවිලි සමාගම**

සභාපති - එන්.ඩී. මඩවල මහතා

දු. අංක - 011 2698058/ 9

ෆැක්ස් - 011 2698057

විද්‍යුත් තැපැල - elkaduwacmanepl@sltnet.lk

- **සී/ ස කුරුණෑගල වැවිලි සමාගම**

සභාපති - ඒ. එම්. පියසෝම උපාලි මහතා

දු. අංක - 037 2229618

ෆැක්ස් - 037 2223191

විද්‍යුත් තැපැල - ampupali0707@yahoo.com

- **සී/ ස හලාවත වැවිලි සමාගම**

සභාපති - ආසිරි කුමාර හේරත් මහතා

දු. අංක - 032 2223210

ෆැක්ස් - 032 2222162

විද්‍යුත් තැපැල - cplhop@gmail.com

- **සී/ ස ගල්ඔය වැවිලි සමාගම**

  සභාපති - කීර්ති බණ්ඩාර කොටගම මහතා

  දු. අංක - 063 5372828

  ෆැක්ස් - 063 2240199

  විද්‍යුත් තැපැල - ceo@galoya.lk

- **ශ්‍රී ලංකා කජු සංස්ථාව**

  සභාපති - ධම්සිරි බණ්ඩාර කරුණාරත්න මහතා

  දු. අංක - 011 2871005

  ෆැක්ස් - 011 2884906

  විද්‍යුත් තැපැල - cashewco@dialogsl.net

- **සී/ස හිඟුරාන සීනි කර්මාන්ත සමාගම**

  සමානාධිකාරී - එම්. එම්. ඉෆ්තිකාර් මහතා

  දු. අංක - 011 2368259

  ෆැක්ස් - 011 2368259

  විද්‍යුත් තැපැල - hsil@sltnet.lk

- **සී/ ස ලංකා සීනි (පුද්) සමාගම**

  සභාපති - මහාචාර්ය එච්. ඩබ්. සිරිල්

  දු. අංක - 011 2505558

  ෆැක්ස් - 011 2500674

  විද්‍යුත් තැපැල - info@lscpl.lk

- **කන්තලේ සීනි සමාගම**

  කළමනාකරණ අධ්‍යක්ෂ - කේ. පී. නාගරාජා මහතා

  දු. අංක - 011 2699888

  විද්‍යුත් තැපැල - kpn@mgsugars.net

- **උක් පර්යේෂණ ආයතනය**

| | | |
|---|---|---|
| සභාපති | - | කේ. ඒ. එෆ්. කරුනාසේන මහතා |
| දු. අංක | - | 011 4389150 |
| ෆැක්ස් | - | 011 2785796 |

## කර්මාන්ත අංශය

- **ලංකා පිඟන් සංස්ථාව**

| | | |
|---|---|---|
| නිසිබලධාරි | - | රියෙන්සි පෙරේරා මහතා |
| දු. අංක | - | 011 4063617 |
| ෆැක්ස් | - | 011 4506415 |
| විද්‍යුත් තැපැල | - | ceylonceramics.co@gmail.com |

- **බීසීසී සමාගම**

| | | |
|---|---|---|
| සභාපති | - | ආර්. පී. එස්. පුෂ්පකුමාර මහතා |
| දු. අංක | - | 011 2435195 |
| ෆැක්ස් | - | 011 2447139 |
| විද්‍යුත් තැපැල | - | bcclankaltd@gmail.com |

# පටුන

පිටු අංකය


1 හැඳින්වීම ........................................................ 1

1 අමාත්‍යාංශයේ දැක්ම සහ මෙහෙවර ........................................................ 3

2 අමාත්‍යාංශයේ කාර්යයන් හා කර්තව්‍යයන් ........................................................ 4

3 අමාත්‍යාංශයේ සංවිධාන සටහන ........................................................ 5

2 අමාත්‍යාංශය සහ එහි අංශයන් ........................................................ 7-10

3 අමාත්‍යාංශයේ විෂය පථයට අයත්වන ආයතන ........................................................ 11-16

4 අමාත්‍යාංශයේ **ප්‍රගතිය** ........................................................ 17-32

5 අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයන්හි කාර්යසාධන ........................................................ 33

i. කර්මාන්ත ........................................................ 35-42

ii. වැවිලි කර්මාන්ත ........................................................ 43-52

6 මුදල් වෙන් කිරීම ........................................................ 53-64

# 1. හැඳින්වීම

# 1. හැඳින්වීම

- 2015 අගෝස්තු මස 17 වන දින පැවති මහ මැතිවරණයත් සමඟ ඇතිවූ නව රජය විසින් 2015 සැප්තැම්බර් 06 වන දින ප්‍රකාශයට පත්කරන ලද නව අමාත්‍යාංශයක් ලෙස මෙහි සමාරම්භය සනිටුහන් වේ.

- 2015 සැප්තැම්බර් 21 දින ප්‍රකාශයට පත් කළ 1933/13 දරණ අති විශේෂ ගැසට් පත්‍රය හා 2015 නොවැම්බර් මස 24 දින ප්‍රකාශයට පත් කළ අංක 1942/10 දරණ අති විශේෂ ගැසට් පත්‍රයන්හි පල වූ අමාත්‍යාංශ කාර්යයන් සහ කර්තව්‍යයන් පිළිබඳ ලේඛනය අනුව මෙම අමාත්‍යාංශය සඳහා රාජ්‍ය ව්‍යවසායයන් සහ ඌන උපයෝජිත වත්කම් විශාල ප්‍රමාණයක වගකීම පැවරී ඇත.

- 2018 මාර්තු මස 28 වන දින ප්‍රකාශයට පත්කරන ලද 2064/ 26 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් මෙම අමාත්‍යාංශයේ විෂය පථයට මහනුවර කලාපය තුළ ආර්ථික හා යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතින් හා වැඩසටහන් අධීක්ෂණය සහ සම්බන්ධීකරණය කරලීමේ වගකීම පැවරේ. තවද 2018 මැයි මස 12 වන දින ප්‍රකාශයට පත්කරන ලද 2070/ 56 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් මෙම අමාත්‍යාංශයේ විෂය පථයට සී/ ස හිඟුරාන සීනි කර්මාන්ත සමාගම,සී/ස ලංකා සීනි (පුද්) සමාගම, කන්තලේ සීනි සමාගම සහ උක් පර්යේෂණ ආයතනය යන ආයතනයන් පැවරෙන අතර, මෙතෙක් මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හා එහි පරිපාලිත සමාගම් සහ අනුබද්ධ සමාගම් (ලිට්රෝ ගෑස් ලංකා ලිමිඩට් හා ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්) සමාගම හැර) මෙම අමාත්‍යාංශයේ විෂය පථයෙන් ඉවත් වේ.

- මෙම අමාත්‍යාංශය වෙත වෙන්වූ ආයතන සංඛ්‍යාව ප්‍රධාන ආයතන 24 කින්ද, පරිපාලිත සමාගම් 26 කින් හා ඌන උපයෝජිත වත්කම් කාණ්ඩයට අයත් ආයතන 37 කින්ද සමන්විත වේ.

- 2018.10.26 දින සිදුවූ අමාත්‍ය මණ්ඩල සංශෝධනයත් සමග මෙම අමාත්‍යාංශයේ විෂය පථය වෙනස් වේ. 2018/11/09 දිනැති අංක 2096/68 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් මෙම අමාත්‍යාංශය වෙළඳ, පාරිභෝගික, සමුපකාර හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය වශයෙන් නම්කෙරේ. අග්‍රාමාත්‍ය ලේකම්ගේ අංක PMO/01/Sec/15 හා 2018.11.12 දිනැති ලිපිය අනුව, රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා විසින් පාවිච්චි කරන ලද කාර්යාලය සහ අනෙකුත් සම්පත් ස්ථිර කාර්ය මණ්ඩලය ද ඇතුළුව වෙළඳ, පාරිභෝගික, සමුපකාර හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය වෙත පැවරීම සිදුවේ.

- 2018/12/28/දිනැති අංක 2103/33 දරණ අතිවිශේෂ ගැසට් පත්‍ර මගින් මෙම අමාත්‍යාංශය රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යාංශය ලෙස නම් කෙරේ.

- තවද 2019/01/16 දිනැති අංක 2106/9 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් මෙම අමාතයාංශයට කන්ද උඩරට උරුමය සුරකීම සඳහා ව්‍යවස්ථාපිත මන්ඩලයට අදාල කටයුතු පැවරීම සිදුවේ.

- රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යාංශයේ ගරු අමාත්‍යවරයා ලෙස ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා ද අමාත්‍යාංශ ලේකම් ලෙස රවීන්ද්‍ර හේවාවිතාරණ මහතා ද කටයුතු කරයි. මෙම අමාත්‍යාංශය කොළඹ 01, ඇව්ලන් චතුරශ්‍රය, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, බටහිර කුළුණ, 07 වන මහලෙහි සහ නැගෙනහිර කුළුණෙහි 36 වන මහලෙහි ගරු අමාත්‍ය කාර්යාලය වශයෙන් පිහිටා ඇත.

## 1.1. අමාත්‍යාංශයේ දැක්ම සහ මෙහෙවර

**දැක්ම**

සෞභාග්‍යමත් දේශයක් උදෙසා සවිමත් රාජ්‍ය ව්‍යවසාය පද්ධතියක්

**මෙහෙවර**

ජාතික ආර්ථිකයට සවියක් වන රටට බරක් නොවන රාජ්‍ය ව්‍යවසාය සංස්කෘතියක් නිර්මාණය කිරීම උදෙසා කැපවීම

## 1.2. රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යාංශයේ කාර්යයන් හා කර්තව්‍යයන්

- රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන විෂයයට අදාලව 2015.09.21 දිනැති අංක. 1933/13 හා 2015.11.24 දිනැති අංක. 1942/10 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයන්හි රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති 11 වැනි තීරුවෙහි දැක්වෙන ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාල ප්‍රතිපත්ති වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

- රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන ක්ෂේත්‍රය තුළ නව දැනුම හා තාක්ෂණය හඳුන්වාදීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම.

- රාජ්‍ය ව්‍යවසායයන්හි නිෂ්පාදිතයන්ගේ ප්‍රමිතිය හා ගුණාත්මකබව වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

- ව්‍යවසායකත්වය, ජාතික ආර්ථික ප්‍රවාහය හා බද්ධ කිරීමට ක්‍රමෝපායන් සැකසීම.

- ඵලදායි සම්පත් උපයෝජනය තුළින් දේශීය ව්‍යවසායයන් ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා යොදා ගැනීමට අවශ්‍ය පියවර ගැනීම.

- රාජ්‍ය බැංකු සහ මූල්‍ය නියෝජිතායතනවලට අදාල පොදු පරිපාලන සහ මෙහෙයවීම් කටයුතු.

- 2015.09.21 දිනැති අංක. 1933/13, 2015.11.24 දිනැති අංක. 1942/10, 2018.03.28 දිනැති අංක 2064/26 හා 2018.05.12 දිනැති අංක 2070/56 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට්පත්‍රයන්හි රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති 11 වැනි තීරුවෙහි සඳහන් රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා රජයට අයත් සමාගම්වල මූල්‍ය පරිපාලනය.

- 2011 අංක. 43 දරණ පනත යටතේ මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා සතු කර ඇති අංක. 1933/13 හා 2015.09.21 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති 11 වැනි තීරුවෙහි, 8 වන කරුණෙහි සඳහන් ආයතන 37හි ඌන උපයෝජිත වත්කම් පුනරුදය සම්බන්ධයෙන් පත්කර ඇති නිසි බලධාරීන් විසින් ඉටු කරනු ලබන ක්‍රියාකාරකම් මෙහෙයවීම හා අධීක්ෂණය.

- රාජ්‍ය ව්‍යවසායයන් කළමනාකරණය කිරීම සඳහා ආයතනික රාමුවක් ස්ථාපිත කිරීම.

- රාජ්‍ය ව්‍යවසායයන් සංවර්ධනය කිරීමේ කටයුතු.

- 2015.09.21 දිනැති අංක. 1933/13, 2015.11.24 දිනැති අංක. 1942/10, 2018.03.28 දිනැති අංක 2064/26 හා 2018.05.12 දිනැති අංක 2070/56 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයන්හි රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති 11 තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියළුම විෂයන්ට අදාල කටයුතු.

- 2015.09.21 දිනැති අංක. 1933/13, 2015.11.24 දිනැති අංක. 1942/10, 2018.03.28 දිනැති අංක 2064/26 හා 2018.05.12 දිනැති අංක 2070/56 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයන්හි රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති 11 තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම.

- මහනුවර නගරය තුළ ආර්ථික හා යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතීන් හා වැඩසටහන් අධීක්ෂණය සහ සම්බන්ධීකරණය කරලීම.

## 1.3. අමාත්‍යාංශයේ සංවිධාන සටහන - 2018



# 2. අමාත්‍යාංශයේ අංශයන්

# රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යාංශය සහ එහි අංශ

## රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යාංශය

දු/ක - **011 2437828 / 011 2437805**

ෆැක්ස් - **011 2437823**

විද්‍යුත් තැපැල minofpubenter@gmail.com

| අංශය | දු/ක | ෆැක්ස් |
|---|---|---|
| පාලන අංශය | 011 2437812 | 011 2437823 |
| ගිණුම් අංශය | 011 2437845 | 011 2437845 |
| සංවර්ධන හා සැලසුම් අංශය | 011 2331356 | 011 2437823 |
| අභ්‍යන්තර විගණන අංශය | 011 2331363 | 011 2331373 |
| බැංකු හා මූල්‍ය අංශය | 011 2331381 | 011 2331391 |
| වැවිලි හා කෘෂිපාදක කර්මාන්ත අංශය | 011 3020341 | 011 2331367 |
| සිවිල් ගුවන්සේවා අංශය | 011 7574269 | 011 2437823 |

# 3. අමාත්‍යාංශයේ විෂය පථයට අයත්වූ ආයතන

# අමාත්‍යාංශය යටතේ පැවති ආයතන

- **<u>බැංකු සහ මූල්‍ය</u>**
    - ලංකා බැංකුව සහ එහි පරිපාලිත සමාගම් 10 හා ආශ්‍රිත සමාගම් 04
    - මහජන බැංකුව සහ එහි පරිපාලිත සමාගම් 03 (උප පරිපාලිත සමාගම් 05)
    - ජාතික ඉතිරිකිරීමේ බැංකුව සහ එහි පරිපාලිත සමාගම් 01
    - රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව
    - ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
    - ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව
    - ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව

- **<u>සිවිල් ගුවන්සේවා</u>**
    - සී/ස ලිට්රෝ ගෑස් ලංකා
    - සී/ස ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා පුද්ගලික සමාගම
    - ශ්‍රී ලන්කන් ගුවන් සේවය සහ එහි පරිපාලිත සමාගම් 01

- **<u>වැවිලි හා කෘෂිපාදක</u>**
    - ජනතා වතු සංවර්ධන මණ්ඩලය
    - ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
    - සී/ස ඇල්කඩුව වැවිලි සමාගම
    - සී/ස කුරුණෑගල වැවිලි සමාගම
    - සී/ස හලාවත වැවිලි සමාගම
    - සී/ස ගල්ඔය වැවිලි සමාගම
    - ශ්‍රී ලංකා කජු සංස්ථාව
    - සී/ ස හිඟුරාන සීනි කර්මාන්ත සමාගම
    - සී/ ස ලංකා සීනි (පුද්) සමාගම සහ එහි පරිපාලිත සමාගම් 02
    - කන්තලේ සීනි සමාගම
    - උක් පර්යේෂණ ආයතනය
    - රාජ්‍ය සම්පත් කළමණාකරන සංස්ථාව

- **<u>කර්මාන්ත</u>**
    - ලංකා පිඟන් සංස්ථාව (ගඩොල් හා උළු) අංශය
    - බීසීසී සමාගම

## අමාත්‍යාංශය යටතේ පැවති පරිපාලිත සමාගම් සහිත ආයතන

➢ <u>ලංකා බැංකුව</u>

- ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් පීඑල්සී
- මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනැන්ස් පීඑල්සී
- සී/ස බීඕසී ට්‍රැවල්ස් (පුද්) සමාගම
- සී/ස බීඕසී මැනේජ්මන්ට් ඇන්ඩ් සපෝර්ට් සර්විසස් (පුද්) සමාගම
- සී/ස බීඕසී ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ඇන්ඩ් මැනේජ්මන්ට් (පුද්) සමාගම
- සී/ස හොටෙල් කළම්බෝ (1963) සමාගම
- සී/ස සී බැන්ක් හොලිඩේ හෝම්ස් (පුද්) සමාගම
- සී/ස එම්බීඑස්එල් ඉන්ෂුවරන්ස් සමාගම
- සී/ස කොළදෙණිය හයිඩ්‍රොපවර් (පුද්) සමාගම
- සී/ස ලංකා බැංකුව (යූකේ) සමාගම

**ආශ්‍රිත සමාගම්**

- සී/ස ලංකා සිකියුරිටීස් (පුද්) සමාගම
- සී/ස ට්‍රාන්ස්නැෂනල් ලංකා රෙකෝඩ්ස් සොලුයුෂන්ෂ් (පුද්) සමාගම
- සදර්න් ඩිවලොප්මන්ට් ෆයිනැන්ෂියල් සමාගම
- සී/ස සී බැන්ක් ඇසෙට් මැනේජ්මන්ට් සමාගම

➢ <u>මහජන බැංකුව</u>

- පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනැන්ස් පීඑල්සී
    - * පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී
    - * පීපල්ස් මයික්‍රො ෆයිනැන්ස් ලිමිටඩ්
    - * පීපල්ස් ලීසිං ප්‍රොපර් ටිඩිවලොප්මන්ට් ලිමිටඩ්
    - * පීපල්ස් ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ්
    - * පීපල්ස් හැව්ලොක් ප්‍රොපටීස් ලිමිටඩ්
- පීපල්ස් මර්චන්ට් ෆයිනැන්ස් පීඑල්සී
- පීපල්ස් ට්‍රැවල්ස් පෞද්ගලික සමාගම

- **<u>ජාතික ඉතිරිකිරීමේ බැංකුව</u>**
  - එන්එස්බී ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පැනි ලිමිටඩ්

- **<u>ශ්‍රී ලංකන් ගුවන් සමාගම</u>**
  - ශ්‍රී ලංකන් කේටරින්

- **<u>සී/ ස ලංකා සීනි (පුද්) සමාගම</u>**
  - පැල්වත්ත සීනි කර්මාන්ත සමාගම
  - සෙවනගල සීනි කර්මාන්ත සමාගම

**2011 අංක 43 දරණ පනත යටතේ මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා සතු කර ඇති අංක 1933/13 හා 2015.09.21 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය යටතේ පවතින ඌන උපයෝජිත වත්කම්**

| | | |
|---|---|---|
| I. | හොටෙල් ඩිවලපර්ස් (ලංකා) ලිමිටඩ් (PQ 143) | *** |
| II. | පිටකොටුවෙහි පිහිටි දේපළ- චාමර්ස් ධාන්‍යාගාරය | * |
| III. | පිටකොටුව හා නාරාහේන්පිට පිහිටි දේපළ - ලංකා ට්‍රැක්ටර්ස් ලිමිටඩ් | * |
| IV. | කොල්ලුපිටියේ පිහිටි දේපළ - කජු සංස්ථාව කලින් පිහිටි ඉඩම | * |
| V. | බත්තරමුල්ලේ පිහිටි දේපළ - සුවිර් නෙබ් ප්‍රොජෙක්ට්ස් ප්‍රයිවට් ලිමිටඩ් | * |
| VI. | කොල්ලුපිටියේ පිහිටි දේපළ - සෙලින්කෝ ලෙෂර් ප්‍රොපර්ටීස් ලිමිටඩ් | * |
| VII. | සීමාසහිත පැල්වත්ත සීනි සමාගම | *** |
| VIII. | සීමාසහිත සෙවනගල සීනි සමාගම | *** |
| IX. | බදුල්ලේ පිහිටි දේපළ - කලම්බු කොමර්ෂල් කම්පැණි | *** |
| X. | සිනෝටෙක්ස් (ලංකා) ලිමිටඩ් | ** |
| XI. | ජැක ලංකා ලිමිටඩ් | ** |
| XII. | ජ්ලයිමත් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ් | ** |
| XIII. | කොස්මොස් මැකී ඉන්ඩස්ට්‍රීස් | ** |
| XIV. | කාබුල් ලේස් (ප්‍රයිවට්) ලිමිටඩ් | ** |
| XV. | ඉන්ටර් ට්‍රේඩ් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් | * |
| XVI. | සීතා පැෂන්ස් ප්‍රයිවට් ලිමිටඩ් | ** |
| XVII. | ඩී.සී.ඇපරල් ප්‍රයිවට් ලිමිටඩ් | ** |
| XVIII. | නීඩ්ල් ක්‍රාෆ්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | ** |
| XIX. | හයි ෆැෂන් ගාමන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් | ** |
| XX. | කොලින්ස් ගාමන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් | ** |
| XXI. | රුහුණු පුතා ඇපරල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | ** |
| XXII. | සන්ජය ගාමන්ට් (ප්රයිවට්) ලිමිටඩ් | ** |
| XXIII. | මැක්ෆා ඇපරල් (ප්‍රයිවට්) ලිමිටඩ් | ** |
| XXIV. | යොහිදා ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | ** |
| XXV. | ඩයනමික් ක්ලෝතින් (ප්‍රයිවට්) ලිමිටඩ් | ** |
| XXVI. | 609 පොලිමර්ස් එක්ස්පෝට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | ** |
| XXVII. | කොස්කෝ පොලිමර් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් | ** |
| XXVIII. | ග්‍රේට් වෝල් ත්‍රෙඩ් මැනුෆැක්චරින්(ප්‍රයිවට්) ලිමිටඩ් | ** |
| XXIX. | ආදම්ජී එක්ස්ට්‍රැක්ෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | ** |
| XXX. | ඩාටා ෆූඩ් (ප්‍රයිවට්) ලිමිටඩ් | ** |
| XXXI. | ටෙන්ඩන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් | ** |
| XXXII. | රිකාන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් | ** |
| XXXIII. | කොම්පොසිට් ටවර් සොලියුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | ** |
| XXXIV. | හෙල්ත් ෆුඩ් ප්‍රඩක්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | ** |
| XXXV. | ශ්‍රී විරාග් (ප්‍රයිවට්) ලිමිටඩ් | ** |
| XXXVI. | රෝයලී එක්ස්පෝට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | ** |
| XXXVII. | කොන්ටිනෙන්ටල් වනස්පති (ප්‍රයිවට්) ලිමිටඩ් | ** |

* - නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා ඇති ආයතන

** - ආයෝජන ප්‍රවර්ධන මණ්ඩලය වෙත පවරා ඇති ආයතන

*** - වෙනත්

# 4. අමාත්‍යාංශයේ ප්‍රගතිය

## 4.2018 වර්ෂය සඳහා අමාත්‍යාංශයේ ප්‍රගතිය

### හැඳින්වීම

- රාජ්‍ය ව්‍යවසායයන් තුළ පවතින අනාගත අවදානම් හා අහිතකර ප්‍රවණතා හඳුනා ගැනීම හා ඒවා අවම කිරීම සඳහා වූ නව උපාය මාර්ගික ක්‍රියාකාරකම් හඳුනා ගැනීම තුළින් රාජ්‍ය ව්‍යවසාය පද්ධතිය තුළ නව ප්‍රබෝධයක් ඇති කිරීම අමාත්‍යාංශයේ වගකීමයි. එසේම ආර්ථික වශයෙන් පාඩු ලබන රාජ්‍ය ව්‍යවසායයන් හඳුනාගෙන ඒවා සමස්ත ජාතික ආර්ථිකයට දායකත්වයක් ලබා දිය හැකි අයුරින් ප්‍රතිව්‍යුහගතකරණයට අවශ්‍ය ක්‍රමවේද හඳුනා ගැනීම සහ ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම අමාත්‍යාංශයේ විෂය පථයට අයත්වේ.

- 2015.09.21 දිනැති අංක. 1933/13, 2015.11.24 දිනැති අංක. 1942/10, 2018.03.28 දිනැති අංක 2064/26 හා 2018.05.12 දිනැති අංක 2070/56 දරණ අති විශේෂ ගැසට් පත්‍රයන්හි පල වූ අමාත්‍යාංශ කාර්යයන් සහ කර්තව්‍යයන් පිළිබඳ ලේඛනය අනුව මෙම අමාත්‍යාංශය සඳහා රාජ්‍ය ව්‍යවසායන් සහ ඌන උපයෝජිත වත්කම් විශාල ප්‍රමාණයක වගකීම පැවරී ඇත. අමාත්‍යාංශය වෙත වෙන්වූ ආයතන සංඛ්‍යාව ප්‍රධාන ආයතන 24 කින්ද, පරිපාලිත සමාගම් 26 කින් හා ඌන උපයෝජිත වත්කම් කාණ්ඩයට අයත් ආයතන 37 කින්ද සමන්විතවේ.

- අමාත්‍යාංශයට අයත් ආයතන පහත අංශයන් යටතේ වර්ගීකරණයට ලක්කර ඇත.

  1. බැංකු හා මූල්‍ය අංශය
  2. සිවිල් ගුවන් සේවා අංශය
  3. වැවිලි, කෘෂිපාදක කර්මාන්ත හා කර්මාන්ත අංශය

2018 වර්ෂය සඳහා මෙම අමාත්‍යාංශය යටතේ පවතින අංශවල ප්‍රගතිය පහත සඳහන් වේ.

### 4.1. පාලන අංශය

පාලන අංශය මඟින් මෙම අමාත්‍යාංශයේ සියළුම අංශවල සේවයේ නියුතු නිලධරීන්ගේ පරිපාලන කටයුතු සිදු කරනු ලබයි. ඒ අනුව, 2018 සම්පූර්ණ වසර තුළ සිදු කරන ලද ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

- **අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල නීතිමය පසුබිම පිළිබඳ තොරතුරු රැස් කිරීම හා වගු ගත කිරීම.**

මෙම අමාත්‍යාංශය යටතේ පවතින ආයතන හා ඒ යටතේ පවතින අනු ආයතන සමඟ ආයතන 47 ක නීතිමය පසුබිම පිළිබඳ තොරතුරු රැස් කිරීම සඳහා එම ආයතනවලට ලිපි යවා ඇති අතර, ඒ අනුව මේ වන විට වැවිලි අංශයට අදාල හිඟුරාන සීනි සමාගම, ලංකා සීනි සමාගම හා උක් පර්යේෂණ ආයතනය හැර අනෙකුත් සියළුම ආයතනවලට අදාල තොරතුරු ලැබී ඇත.

- **බාහිර ගත පුහුණුව**

අමාත්‍යාංශ නිලධාරීන් 48 දෙනෙකුගේ සහභාගීත්වයෙන් ඇල්කඩුව වැවිලි සමාගමට අයත් මාතලේ දිස්ත්‍රික්කයේ පිහිටි සෙම්බුවත්ත පුහුණු මධ්‍යස්ථානයේදී 2018.06.22 දින සිට 24 දින දක්වා තෙදින නායකත්ව පුහුණු වැඩමුළුවක් පවත්වන ලද අතර, ඒ සඳහා රු. 613,492/- ක මුදලක් වැයවී ඇත.

එහිදී අමාත්‍යාංශ නිලධාරීන් කණ්ඩායම් 4කට වෙන් කර, ඔවුන් සඳහා කණ්ඩායම් ක්‍රියාකාරකම් 11 ක් ලබා දෙන ලදි. ඒ සඳහා ලකුණු ලබා දෙන අතර, හොඳම කණ්ඩායම හා ඉහළ දක්ෂතා පෙන්වන ලද නිලධාරින් තිදෙනෙකු තෝරා ගන්නා ලදි.

එයට අමතරව නිලධාරීන්ගේ ශාරීරික යෝග්‍යතාව සඳහා යෝගා ව්‍යායාම වැඩසටහනක් ද පවත්වන ලදි.







- **දේශීය කෙටිකාලීන පුහුණු පාඨමාලා**

  **2018 වර්ෂය** තුළ අමාත්‍යාංශ නිලධාරීන් 12 දෙනෙකු දේශීය කෙටිකාලීන පුහුණු පාඨමාලා සඳහා යොමු කර ඇත. ඒ සඳහා පාඨමාලා ගාස්තු ලෙස රු.100,000/- ක මුදලක් ගෙවා ඇත.

- **දේශීය දිගුකාලීන පුහුණු පාඨමාලා**

  **2018 වර්ෂය** තුළ අමාත්‍යාංශ නිලධාරීන් තිදෙනෙකු දේශීය දිගුකාලීන පුහුණු පාඨමාලා සඳහා යොමු කර ඇත. ඒ සඳහා පාඨමාලා ගාස්තු ලෙස රු.270,000/- ක මුදලක් ගෙවා ඇත.

- **විදේශීය පුහුණු පාඨමාලා**

  **2018 වර්ෂය** තුළ අමාත්‍යාංශයේ මාණ්ඩලික නිලධාරින් දසදෙනෙකු විදේශීය පුහුණු පාඨමාලා සඳහා යොමු කර ඇත. ඒ සඳහා පාඨමාලා ගාස්තු ලෙස රු.2,364,800/- ක මුදලක් ගෙවා ඇත.

- **ප්‍රායෝගික පුහුණුව සඳහා පුහුණුලාභීන් බඳවා ගැනීම.**

2018 වර්ෂය තුළ කාර්මික විද්‍යාලයේ පුහුණුලාභීන් තිදෙනෙකු සඳහාද, විශ්ව විද්‍යාල උපාධි අපේක්ෂිකාවන් සිව් දෙනෙකු සඳහාද ප්‍රායෝගික පුහුණුව ලබා දී ඇත. ඒ සඳහා පුහුණු දීමනා ලෙස රු. 350,000/- ක මුදලක් ගෙවා ඇත.

## 4.2. සංවර්ධන හා සැලසුම් අංශය

### 4.2.1. අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.

2018 වර්ෂයට අදාළව අමාත්‍යාංශය වෙනුවෙන් පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව එක් එක් අංශ මඟින් අදාළ කාර්යයන් ඉටු කිරීම සම්බන්ධයෙන් නිරීක්ෂණය කිරීම හා කාර්තුගත ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.

මෙහිදී 2018 වසරට අදාලව ප්‍රගති සමාලෝචන රැස්වීම් තුනක් පවත්වා ඇත.

- **අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයන්ට අදාළව හඳුනාගත් මූලික කාර්ය සාධක දර්ශකයන්ට අනුකූලව ප්‍රගතිය සමාලෝචනය සිදු කිරීම.**
  මෙහි දී අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල ප්‍රථම හා දෙවන කාර්තුවල ප්‍රගතිය සමාලෝචනය සිදු කරන ලදී.

**2018.05.12 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 2070/56 යටතේ අමාත්‍යාංශයේ විෂය පථයට අලුතින් එක් වු සී/ස හිඟුරාණ සීනි කර්මාන්ත සමාගම, සී/ස ලංකා (පුද්.) සමාගම, කන්තලේ සීනි සමාගම හා උක් පර්යේෂණ ආයතනය යන සීනි නිෂ්පාදන** ක්ෂේත්‍රය නියෝජනය කරන ආයතන සියල්ල එකට ඒකරාශී කොට ඔවුන් විසින් සිදු කරනු ලබන කාර්ය හා කර්තව්‍ය සිදු කරගෙන යාමේදී කර්මාන්ත ක්ෂේත්‍රයක් වශයෙන් මුහුණ දෙන පොදු ගැටලු සාකච්ඡා කිරීම සඳහා ප්‍රගති සමාලෝචන වැඩසටහනක් 2018.10.26 දින උඩවලව පිහිටි උක් පර්යේෂණ ආයතනයේදී පවත්වන ලදී.



### 4.2.2. 2017 වර්ෂයේ කාර්ය සාධන වාර්තාව පිළියෙල කිරීම.

2017 මූල්‍ය වර්ෂයේ අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල කාර්ය සාධනය විදහා දක්වමින් 2017 කාර්ය සාධන වාර්තාව 2018 මැයි 31 දිනට පෙර පිළියෙල කර ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබීය. මෙම වර්ෂයේ අදාළ වාර්තාවේ දෘඪ පිටපත් 150 ක් හා මෘදු පිටපත් 400 ක් මුද්‍රණය කළ අතර, මේ සඳහා රු.629,000 ක මුදලක් වැය කරන ලදී.

## 4.3. බැංකු හා මූල්‍ය අංශය

- රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යාංශය රාජ්‍ය බැංකුවල අවම සංචිත ප්‍රමාණය පිළිබඳව හොඳින් අධීක්ෂණය කිරීම අඛණ්ඩව සිදුකරන අතර අවදානම් නිරීක්ෂණය වන්නේ නම් ඒ පිළිබඳව අදාල බලධාරීන්ට දන්වනු ලැබේ. නිවාස හා මූල්‍ය සංස්ථා බැංකුව 2018.05.12 දරණ විශේෂ ගැසට් පත්‍රය මගින් නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වුවද එය මෙම අමාත්‍යාංශය යටතේ පවතින කාලය තුළ බැංකුවේ ප්‍රාග්ධන අවශ්‍යතා හා අපේක්ෂිත වර්ධන ඉලක්ක සපුරාලීම සඳහා රු. බිලියන 1.4 ක අතිරේක ප්‍රාග්ධන ආයෝජනයක් සපුරා දීමට අවශ්‍ය ප්‍රතිපාදන සිදු කරන ලදී.

- කුඩා රාජ්‍ය බැංකු අහෝසි කිරීම සඳහා වන 2015 අයවැය යෝජනාව අනුව ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවේදී (CCEM) ගනු ලැබූ තීරණ පරිදි අමාත්‍යාංශය විසින් මෙම ආයතන ඒකාබද්ධ කිරීමේ කටයුතු සම්බන්ධයෙන් එකී ආයතන සමඟ කටයුතු කෙරේ. ඒ අනුව,

    I. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව හා ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව ඒකාබද්ධ කිරීමේ කටයුතු සිදු වෙමින් පවතින අතර මේ වන විට නිසිකාර්ය ඇගයීම සහ ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලියේ දැනට පවතින නීතිමය ගැටළු පිළිබඳව විසඳුම් ලබා ගැනීමට කටයුතු කරගෙන යන අතර එහි අවසන් අදියරට ළඟා වෙමින් පවතී.

    II. ජාතික ඉතිරි කිරීමේ බැංකුව හා ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව ඒකාබද්ධ කිරීමට අදාළ වාර්තා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉදිරිපත් කර ඇත.

- නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කළ 1961 අංක 29 දරණ මහජන බැංකු සංශෝධන පනත් කෙටුම්පත හා එහි නෛතික ප්‍රතිඵල සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාත්‍රයෙන් යුක්තව ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා රජයේ මුද්‍රණාලය වෙත ඉදිරිපත් කර ඇත.

- මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයේ ඇතිවූ කළහකාරී සිදුවීම් හේතුවෙන් හානි වූ ව්‍යාපාරික දේපළ සඳහා සහනයක් සලසා දීම වෙනුවෙන් සහනදායී පොළී අනුපාතයක් මත අත්වැල ණය යෝජනා ක්‍රමය හඳුන්වා දෙන ලදි. ඒ සඳහා රුපියල් මිලියනයක උපරිමයකට යටත්ව ණය ලබා දීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කෙරින.

## 4.4. සිවිල් ගුවන් සේවා අංශය

- **ශ්‍රී ලංකන් ගුවන් සමාගම ප්‍රතිව්‍යුහගත කිරීම**

ශ්‍රී ලංකන් ගුවන් සමාගම වසර 10 කට වැඩි කාලයක් තිස්සේ අධික ණය අර්බුදයකට මුහුණ දී සිටී. එබැවින්, ජාතික ගුවන් සේවය තවදුරටත් පවත්වාගෙන යාම සඳහා උපායමාර්ගික සැලැස්මක් පිළියෙල කර ඉදිරි ක්‍රියාමාර්ග සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමට අමාත්‍යවරුන්ගෙන් සැදුම්ලත් අමාත්‍ය මණ්ඩල කමිටුවක් සහ නිලධාරි කමිටුවක් පත් කරන ලදි.

ඒ අනුව, ජාත්‍යන්තර ගුවන් සේවා උපදේශක සමාගමක් වන Nyras ආයතනයේ සහයෝගය ඇතිව සකස් කරන ලද ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ ප්‍රතිව්‍යුහගත කරණ සැලැස්ම එම සමාගමේ නව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති අතර අදාල සැලැස්ම අමාත්‍ය මණ්ඩල අනුමතිය සඳහා ඉදිරිපත් කිරීමට අපේක්ෂිතය.

ගුවන් සමාගමට අදාල ප්‍රතිව්‍යුහගතකරණ සැලැස්මේ මූලික ප්‍රස්තුතය වනුයේ සිය ගුවන් සේවා ජාලය ශක්තිමත් කිරීම, ආයතනික කාර්ය මණ්ඩලය නියමිත ප්‍රමාණයට පවත්වා ගැනීම, ණය බදු සහ ඉන්ධන සම්බන්ධව පවතින ගැටළු නිරාකරනය කරගැනීම තුළින් ගුවන් සමාගම ප්‍රතිව්‍යුහගතකරණය කිරීමයි.

ප්‍රතිව්‍යුහගත කිරීමේ අනෙක් මූලික පරමාර්ථය වන්නේ රාජ්‍ය පුද්ගලික හවුල්කාරීත්ව (PPP) වැඩසටහන හරහා ගුවන් සමාගමට සුදුසු කොටස් කරුවෙකු සොයා ගැනීමයි. ඉන්පසුව, මෙම සැලැස්ම ක්‍රියාවට නැංවීම ආරම්භ කෙරෙන අතර ප්‍රතිව්‍යුහගතකරණයේ පූර්ණ ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා අවම වශයෙන් අවුරුදු දෙක තුනක කාලයක් අවශ්‍ය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

- **කොළඹ හිල්ටන් හෝටලයේ (Hilton Hotel Colombo) හා කොළඹ ග්‍රෑන්ඩ් හයට් (Grand Hyatt Colombo) හෝටලයේ හිමිකාරත්වය ප්‍රතිව්‍යුහගත කිරීම**

කොළඹ හිල්ටන් හෝටලය (Hilton Hotel Colombo) සහ කොළඹ ග්‍රෑන්ඩ් හයට් හෝටලය (Grand Hyatt Colombo) සම්බන්ධයෙන් වන රජයේ හිමිකාරත්වය බැහැර කිරීම සඳහා 2017.08.01 වන දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබාදී ඇත.

ඒ අනුව, කොළඹ හිල්ටන් හෝටලය (Hilton Hotel Colombo) සහ කොළඹ ග්‍රෑන්ඩ් හයට් (Grand Hyatt Colombo) හෝටලය සඳහා උපායමාර්ගික හවුල්කරුවෙකු සොයා ගැනීම වෙනුවෙන් ගනුදෙනු පිළිබඳ උපදේශකයෙකු (Transaction Advisor) ලබාගැනීම සඳහා යෝජනා කැඳවීම් සිදු කර ඇත. ඒ සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් උපදේශක ප්‍රසම්පාදන කමිටුවක් (CACPC) පත් කර ඇති අතර එම කමිටුව විසින් ලද යෝජනා ඇගයුමට ලක් කරන ලදී. ඒ අනුව ගනුදෙනු පිළිබඳ උපදේශක ලෙස කටයුතු කිරීම සඳහා M/S Lazard Asia Ltd, Singapore ආයතනය එම කමිටුව විසින් නිර්දේශ කර තිබේ.

2018.03.28 දිනැති අති විශේෂ ගැසට් පත්‍ර අංක 2064/26 මගින් කොළඹ ග්‍රෑන්ඩ් හයට් හෝටලය ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය යටතේ ලැයිස්තුගත කර ඇති අතර කොළඹ හිල්ටන් හෝටලය 2018.05.12 දිනැති අති විශේෂ ගැසට් පත්‍ර අංක 2070/56 මෙම අමාත්‍යාංශ විෂය පථයෙන් ඉවත් කොට 2018.05.22 දිනැති අති විශේෂ ගැසට් පත්‍ර අංක 2072/16 මගින් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ලැයිස්තුගත කර ඇත. එබැවින්, අදාල ලේඛන එම අමාත්‍යාංශ වෙත භාර දෙන ලදී.







**යෝජිත ප්‍රතිව්‍යුහගතකරණ ව්‍යාපෘතිය - කොළඹ ග්‍රෑන්ඩ් හයට් හෝටලය**

- **මිහින් ලංකා සමාගම ඈවර කිරීම**

2018 ඔක්තෝබර් 31 දිනැති අංක 17/3383 / 733/026 දරන අමාත්‍ය මණ්ඩල තීරණ මත මිහින් ලංකා (පුද්ගලික) සමාගම ඈවර කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් උපදෙස් ලබා දී ඇත. ඒ අනුව, අදාල සමාගම ඈවර කිරීම පිළිබඳ නඩුව ශ්‍රී ලංකා වාණිජ මහාධිකරණයෙහි පවරන ලදුව අධිකරණය විසින් ස්ථිර ඈවරකරුවකු පත්කර තිබේ. එම ඈවරකරු විසින් ඊට අදාල හමාර කිරීමේ ප්‍රකාශයන් උසාවිය තුළ ගොනු කිරීමේ නිරතව සිටී.

2018 නොවැම්බර් මස 05 වන දිනැති අංක 2096/17 දරන අති විශේෂ ගැසට් නිවේදනයට අනුව ශ්‍රී ලංකන් ගුවන් සමාගම සහ මිහින් ලංකා සමාගම ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශ විෂය පථය යටතේ ලැයිස්තුගත කර ඇත. ඒ අනුව, මෙම අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යනු ලැබූ ලිපිගොනු හා අදාළ ලියකියවිලි 2018 දෙසැම්බර් මස 11 වන දින ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය වෙත භාර දෙන ලදී.

## 4.5. වැවිලි කර්මාන්ත අංශය

වැවිලි හා කර්මාන්ත අංශය මගින් පහත සඳහන් ව්‍යවසායන් අධීක්ෂණය කරනු ලබන අතර, 2018 වර්ෂය සඳහා ප්‍රගතිය පහත පරිදි වේ.

- ජනතා වතු සංවර්ධන මණ්ඩලය - **( JEDB )**
- ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව - **( SLSPC )**
- ඇල්කඩුව වැවිලි සමාගම - **( EPL )**
- කුරුණෑගල වැවිලි සමාගම - **( KPL )**
- හලාවත වැවිලි සමාගම - **( CPL )**
- ශ්‍රී ලංකා කජු සංස්ථාව - **(SLCC )**
- ගල් ඔය වැවිලි සමාගම - **( GOPL )**
- ලංකා පිඟන් සංස්ථාව - **( CCC )**
- බීසීසී ලංකා සමාගම - **( BCC )**

- **වැවිලි සමාගම් ප්‍රතිව්‍යුහගතකරණය**

රාජ්‍ය ව්‍යවසාය අමාත්‍යාංශය යටතේ ආර්ථික සංවර්ධනය සඳහා ජනතා වතු සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව , ඇල්කඩුව වැවිලි සමාගම , ගල් ඔය වැවිලි සමාගම , කුරුණෑගල වැවිලි සමාගම , හලාවත වැවිලි සමාගම සහ ශ්‍රී ලංකා කජු සංස්ථාව යන ආයතන ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා 2017.11.23 දිනැතිව අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරන ලදී.

ඒ අනුව 2018.01.12 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ප්‍රතිව්‍යුහගතකරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපත්තිමය වශයෙන් ආයතනික කාර්ය සාධන මට්ටම් සලකා බලා අලාභ ලබමින් තිබෙන ජනතා වතු සංවර්ධන මණ්ඩලය ,ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව,ඇල්කඩුව වැවිලි සමාගම යන ආයතන සඳහා මෙම ක්‍රියාවලියේදී ප්‍රමුඛත්වය ලබා දී ඇත.

ප්‍රතිව්‍යුහගතකරණ වැඩපිළිවෙල හරහා හඳුනාගත් ඌණ උපයෝජිත හා භාවිත නොකළ ඉඩම් ආර්ථික කටයුතු සඳහා යෙදවීමට සුදුසු ආයෝජකයින් සොයාගැනීම සඳහා අමාත්‍යාංශයේ මග පෙන්වීමෙන් අදාල වැවිලි සමාගම් විසින් අභිලාශයන් කැඳවීම ( EOI ) හා යෝජනා කැඳවීම ( RFP ) සිදු කර ඇත. ගරු රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යවරයාගේ සහ අමාත්‍යාංශ ලේකම්වරයාගේ ප්‍රතිපත්තිමය මගපෙන්වීම් යටතේ වැවිලි හා කර්මාන්ත අංශය විසින් උපදේශන සේවා, රැස්වීම් හා වැඩමුළු පවත්වමින් මෙම වැඩපිළිවෙල සඳහා පහසුකම් සළසන ලදී. අදාල ක්‍රියාවලියේදී වැවිලි සමාගම් වෙත ඉදිරිපත් වූ ව්‍යාපෘති යෝජනා අතරින් ක්‍රියාත්මක කිරීමට සුදුසු බවට හඳුනාගන්නා ලද කුඩා හා විශාල පරිමාණයේ යෝජනා සංඛ්‍යාව පහත වගුවේ දැක්වේ.

| | වැවිලි සමාගම | කුඩා පරිමාණයේ යෝජනා සංඛ්‍යාව | විශාල පරිමාණයේ යෝජනා සංඛ්‍යාව | මුළු යෝජනා සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1. | ජනතා වතු සංවර්ධන මණ්ඩලය | 127 | 29 | 156 |
| 2. | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව | 42 | 04 | 46 |
| 3. | ඇල්කඩුව වැවිලි සමාගම | 50 | 04 | 54 |
| | **එකතුව** | **219** | **37** | **256** |

වැවිලි උපදේශක කමිටුව විසින් ඉහත යෝජනා ඇගයුමට ලක් කළ අතර අමාත්‍යාංශ විද්වත් මණ්ඩලයේ උපදේශකයන් ඒ සඳහා සහය විය තවද මුදල් අමාත්‍යාංශය සහ මෙම අමාත්‍යාංශය ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශයක් අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත යොමු කර ඇත.

- **වැවිලි සමාගම්වල පැවැත්ම සඳහා සහය වීම**

නියගය සහ කළමනාකරණ ගැටළු හේතුවෙන් ජනතා වතු සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, ඇල්කඩුව වැවිලි සමාගම යන ආයතන සිය මුදල් ප්‍රවාහය සම්බන්ධ ගැටළුලට මුහුණ පාන සෑම අවස්ථාවකදීම මහා භාණ්ඩාගාරය හරහා මූල්‍ය ආධාර ලබා දීමෙන් අදාල වැවිලි සමාගම්වලට සහය වීමට අමාත්‍යාංශය කටයුතු කර ඇත.

| | **වැවිලි සමාගම** | **ලබා දී ඇති භාණ්ඩාගාර ප්‍රතිපාදන ජනවාරි සිට ජුනි දක්වා (රු.මි)** |
|---|---|---|
| 01. | ජනතා වතු සංවර්ධන මණ්ඩලය | 43 |
| 02. | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව | 270 |
| 03. | ඇල්කඩුව වැවිලි සමාගම | - |
| | මුළු සංඛ්‍යාව | 313 |

- **සේවක අර්ථ සාධක අරමුදල්, සේවක භාරකාර අරමුදල් සහ වෙනත් ස්ථාපිත ගෙවීම් පියවීම සඳහා ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීමට පහසුකම් සැලසීම.**

මෙම අමාත්‍යාංශයේ උපදෙස් මත ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව මගින් 2016 ජනවාරි මස සිටත්, ඇල්කඩුව වැවිලි සමාගම මගින් 2016 ජූනි මස සිටත්, ජනතා වතු සංවර්ධන මණ්ඩලය මගින් 2017 ජූනි මස සිටත් වර්තමාන කාල සීමාව සඳහා අදාල සේවක අර්ථ සාධක අරමුදල් සහ සේවක භාරකාර අරමුදල් ගෙවනු ලබයි.

සේවක අර්ථසාධක අරමුදල් සහ සේවක භාරකාර අරමුදල් පියවීම සඳහා එම ආයතන වල මුදල් ප්‍රවාහය ජනනය කිරීම වෙනුවෙන් දැව අස්වනු නෙලීමේ වැඩසටහන කඩිනම් කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා අවශ්‍ය පහසුකම් අමාත්‍යාංශය මගින් සලසා දී ඇත. තවද හිග සේවක අර්ථසාධක අරමුදල් සේවක භාරකාර අරමුදල් සහ අනෙකුත් ව්‍යවස්ථාපිත ගෙවීම් සඳහා ජනතා වතු සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සහ ඇල්කඩුව වැවිලි සමාගම විසින් අමාත්‍යාංශයේ සහය ඇතිව ක්‍රියාකාරි සැලැස්මක්ද සකස් කර ඇති අතර මේ පිළිබඳ අමාත්‍යාංශය මගින් නිරන්තර අධීක්ෂණය කිරීමද සිදු කරනු ලබයි.

මෙම වැවිලි සමාගම්වල හිඟ සේවක අර්ථසාධක හා භාරකාර අරමුදල් පියවීම සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන ලබා දීම සඳහාද මෙම අමාත්‍යාංශය මගින් කටයුතු කර ඇත. ඒ අනුව පහත සඳහන් පරිදි වැවිලි සමාගම් වෙත මුදල් ප්‍රතිපාදන ලබා දීමට කටයුතු කර ඇත.

**( රු.මි )**

| | වැවිලි සමාගමේ නම | 2016 දී ලබා දී ඇති මුදල | 2017 ලබා දී ඇති මුදල | 2018 ලබා දී ඇති මුදල | ගෙවා ඇති මුළු භාණ්ඩාගාර ප්‍රතිපාදන |
|---|---|---|---|---|---|
| 01. | ජනතා වතු සංවර්ධන මණ්ඩලය | 30 | 305 | 114 | 449 |
| 02. | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව | - | 134 | 155 | 289 |
| 03. | ඇල්කඩුව වැවිලි සමාගම | - | 107 | 95 | 202 |
| | එකතුව | 30 | 546 | 364 | 940 |

- **වැවිලි සමාගම්වල දැව හෙළීම් කටයුතු අධීක්ෂණය කිරීම**

ජනතා වතු සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව,ඇල්කඩුව වැවිලි සමාගම,හලාවත වැවිලි සමාගම,කුරුණෑගල වැවිලි සමාගම යන වැවිලි සමාගම්වල දැව හෙළීමට ප්‍රථම අමාත්‍යාංශ අනුමැතිය ලබා ගත යුතු බව වැවිලි සමාගම් දැනුවත් කර ඇත. ඒ අනුව සෑම වැවිලි සමාගමකම ගස් හෙළීම් කිරීමට ප්‍රථම අමාත්‍යාංශ නිලධාරීන් විසින් ක්ෂේත්‍ර පරීක්ෂණයකට ලක් කර ඒ සඳහා අනුමැතිය ලබා දීම සිදු වේ.

ඒ අනුව වැවිලි සමාගම්වල දැව හෙළීම් සම්බන්ධව නිවැරදි අධීක්ෂණයක් මෙම අමාත්‍යාංශය මගින් සිදු කරනු ලබයි. මෙම වර්ෂය තුල ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ ක්ෂේත්‍ර පරීක්ෂණ 04 ක්,කුරුණෑගල වැවිලි සමාගමේ ක්ෂේත්‍ර පරීක්ෂණ 03 ක් සහ හලාවත වැවිලි සමාගමේ ක්ෂේත්‍ර පරීක්ෂණ 02 ක් සිදු කර ඇත.






(අමාත්‍යාංශ නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් මගින් වැවිලි සමාගම්වලට අයත් වතුයායන්හි දැව හෙලීම් ක්ෂේත්‍ර පරීක්ෂාව සිදු කරමින්)

- **වතු කම්කරුවන්ගේ නිවාස වැඩ සටහනට ඔප්පු ලබා දීම සඳහා අවශ්‍ය මග පෙන්වීම සහ පහසුකම් සැලසීම.**

කඳුරට නව ගම්මාන යටිතල පහසුකම් සහ ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අංක 17/1323/36/00-1 දරණ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව පිළිබඳ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව වතු කම්කරුවන්ගේ නිවාස වැඩ සටහන වෙනුවෙන් එක් වතු කම්කරුවෙකුට පර්චස් 07 ක් බැගින් ලබා දීමේ වැඩ සටහන සඳහා අවශ්‍ය මග පෙන්වීම සහ පහසුකම් සැලසීම සිදු කර ඇත.

මෙම වැඩසටහන සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව විසින් ඉඩම් හෙක්ටයාර 129.88 ක් , ඇල්කඩුව වැවිලි සමාගම විසින් ඉඩම් හෙක්ටයාර 49.72 ක් ජනතා වතු සංවර්ධන මණ්ඩලය විසින් ඉඩම් හෙක්ටයාර 138.72 ක් වෙන් කර ඇත.

මෙම වැඩසටහන යටතේ මේ වන විට ශ්‍රී ලංකා රාජ්ය වැවිලි සංස්ථාවේ ඉඩම් සඳහා ප්‍රධාන පත්‍ර 840 ක් සහ ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ ඉඩම් සඳහා ප්‍රධාන පත්‍ර 385 ක් ලබා දී ඇත.






(මහනුවර - ගලහ, පුපුරැස්ස ලෙවලන් හි ඉදිකල හරිත රන් නිවාස යෝජනා ක්‍රමය ජනතා අයිතියට පත්කිරීමේ උත්සවය)

- **ඉඩම් මැනුම් කිරීම සඳහා සහ වත්කම් තක්සේරු කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම**

අවම කාර්ය සාධන මට්ටමක් පෙන්නුම් කරන ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සමාගම සහ ජනතා වතු සංවර්ධන මණ්ඩලය යන වැවිලි සමාගම්වල ඉඩම් මැනුම් කිරීම අත්‍යාවශ්‍ය කාර්යක් ලෙස හඳුනාගන්නා ලද අතර ඒ සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන මෙම අමාත්‍යාංශය මගින් වෙන් කිරීමට කටයුතු කර ඇත. තවද ඇල්කඩුව වැවිලි සමාගමේ වත්කම් තක්සේරු කිරීම ද කඩිනමින් කළ යුතු කාර්යක් ලෙස හඳුනාගන්නා ලද අතර ඒ සඳහා ද මුදල් වෙන් කිරීමද සිදු කර ඇත.

- **කුරුණෑගල සහ හලාවත වැවිලි සමාගම් සඳහා ප්‍රසාද දීමනා සහ දිරිදීමනා ගෙවීම පිළිබඳ පොදු ක්‍රමවේදයක් සකස් කිරීම**

කුරුණෑගල සහ හලාවත වැවිලි සමාගම්වල සේවකයන් සඳහා ප්‍රසාද දීමනා සහ දිරි දීමනා ගෙවීම සම්බන්ධයෙන් වන විෂමතා විසඳීමට ප්‍රසාද දීමනා සහ දිරිදීමනා පිළිබඳ පොදු ක්‍රමවේදයක් අදාල පාර්ශවකරුවන්ගේද උපදෙස් ඇතිව සකස් කරන ලදුව රාජ්‍ය ව්‍යපාර දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.




(කුරුණෑගල වැවිලි සමාගමේ කාර්ය මණ්ඩලයට 2017 වර්ෂය සඳහා සේවක දිරි දීමනා ලබාදීම)

- **තාවකාලිකව ලෙලි කජු ආනයනය සහ අපනයනය වැඩසටහන**

දේශීය වෙළඳපොලේ කජු හිඟය පියවීම සඳහා නැවත අපනයනය වෙනුවෙන් තාවකාලිකව ලෙලි කජු ආනයනය සහ අපනයනකය වැඩසටහන සඳහා පහසුකම් සලසා දෙන ලදි. කෘෂිකර්ම අමාත්‍යාංශය සහ ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශයේ උපදේශකත්වය සහිත මෙම වැඩ සටහන ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය සකස් කර ඇති අතර අදාල අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කල ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශයක් මගින් ඒ සඳහා අනුමැතිය ලබා ගෙන ඇත.

- **ශ්‍රී ලංකා පිගන් සංස්ථාව ප්‍රතිව්‍යුහගත කිරීම**

ලංකා පිඟන් සංස්ථාව සතුව පවතින කම්හල් 8 න් වැ උඩ කර්මාන්තශාලාව රෝහලක් ඉදිකිරීම සඳහා කැබිනට් මණ්ඩලය වෙත යොමු කර ඒ සඳහා අනුමැතිය ලබා ඇත.

## 4.6. කන්ද උඩරට උරුමය සුරැකීම සඳහා අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩලය

අධිරාජ්‍යවාදීන්ගෙන් කන්ද උඩරට රාජධානියට සිදුවූ හානිය සමථයකට පත් කිරීම පිණිස 1950 දශකයේ උඩරට ගැමි පුනරුත්ථාපන කොමිෂම හා දෙපාර්තමේන්තුව පිහිටුවනු ලැබීය. එමඟින් සැලකිය යුතු ප්‍රමාණයක සංවර්ධනයක් උවත් එකී ආයතන 2014 දිවිනැගුම පනත මඟින් අහෝසි කරනු ලැබී ය. මෙම තත්ත්වය මත කන්ද උඩරට ජනතාවගේ සමාජ, ආර්ථික හා සංස්කෘතික උරුමයන් සුරැකීමට හා පෝෂණය කිරීමට ව්‍යවස්ථාපිත ආයතනයක් පිහිටුවන ලෙසට අස්ගිරි, මල්වතු මහා විහාරයන්හි මහා නායක ස්වාමීන් වහන්සේලා විසින් අතිගරු ජනාධිපතිතුමාට කරන ලද අනුශාසනාවකට අනුව ගරු ජනාධිපතිතුමා විසින් අංක 2020/76 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනයෙන් “කන්ද උඩරට උරුමය පිළිබඳ විෂය අමාත්‍යාංශයකට පවරා කන්ද උඩරට උරුමය පිළිබඳ ව්‍යවස්ථාපිත මණ්ඩලය පිහිටුවනු ලැබීය.

ඒ අනුව කන්ද උඩරට උරුමය සුරැකීම සඳහා අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩලය නිල වශයෙන් 2018 මාර්තු 02 වන දින සිට ක්‍රියාත්මක වේ.

මෙම ආයතනයේ විෂයපථයට අදාල බල ප්‍රදේශයන් ලෙස පහත සඳහන් දිස්ත්‍රික්කයන් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හඳුනා ගැනේ.

1. මහනුවර
2. මාතලේ
3. නුවරඑළිය
4. බදුල්ල
5. මොණරාගල
